කාන්තා හා ළමා කටයුතු චක්‍රලේඛ : 02/2017

සියළුම දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත,

**"ළමා දිරිය" වැඩසටහන යටතේ පෙර පාසල් ගුරුවරියන්ට රු.250 ක මාසික දීමනාවක් ලබා දිම**

මුල් ළමාවිය දරුවන්ගේ රැකවරණය හා සංවර්ධනය වෙනුවෙන් මහගු කාර්ය භාරයක් ඉටු කරන පෙර පාසල් ගුරුවරුන්ගේ සේවය ඇගයීම හා ක්ෂේත්‍රයේ ගුණාත්මක භාවය ඉහල නැංවීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක, පෙර පාසල් ගුරුවරියන්ට රු. 250 ක මාසික දීමනාවක් ලබාදීමේ "**ළමා දිරිය**"වැඩසටහන 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා පහත උපදෙස් කෙරෙහි ඔබගේ අවධානය යොමුකරවමි.

**අවලංගු කිරීම.**

01.මීට අමතරව මෙම වැඩසටහන සම්බන්ධයෙන් 2016 වර්ෂයට අදාලව ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තුමියගේ අත්සනින් නිකුත්කරන ලද 2016-03-31 දිනැති චක්‍රලේඛය අවලංගු බව දන්වා සිටිමි.

**ප්‍රතිලාභීන් තෝරාගැනීම හා වාර්තා කිරීම**

02. CS/LD1 සම්පූර්ණ කර ලැබෙන අයදුම් පත්‍ර සලකමින් මුල් ළමා විය සංවර්ධන සහකාර(එම නිලධාරියා නොමැති අවස්ථාවල ප්‍රාදේශීය ලේකම් විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියකු ) විසින් මෙහි 08හි සඳහන් අදාල නිර්ණායකයන්ට අනුව දිමනාව ලබා දීමට සුදුසු පෙර පාසල් ගුරුවරියන් සම්බන්ධව CS/LD2 ආකෘතිය සකස් කල යුතු අතර (මෙය පිටපත් 3 කින් සකස් විය යුතුය) එම CS/LD2 ආකෘතියට, පිළිවෙලින් පළාත් පෙර පාසල් ඒකකයේ/ පළාත් දෙපාර්තමේන්තුවේ/ අධිකාරියේ* නිර්දේශය හා ප්‍රාදේශීය ලේකම් ගේ අනුමැතිය ලබා ගත යුතුය.

03. උක්ත නිර්දේශයන් හා අනුමැතීන් ලබා ගත් CS/LD2 ආකෘති පිටපත්, අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ (නිල් පාට පිටපත) හා ළමා ලේකම් කාර්යාලයේ (කහ පාට පිටපත) දැන ගැනීම සඳහා යොමු කල යුතු අතර එම තොරතුරු වලට අදාලව මුල් ළමාවිය සංවර්ධන සහකාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී විසින් CS/LD3 ආකෘතිය සකස් කර දිස්ත්‍රික් ලේකම් මඟින්, ළමා ලේකම් කාර්යාලය වෙත යොමු කල යුතුය.

**දීමනාව ලබාදීම**

04. ඊට අදාලව ළමා ලේකම් කාර්යාලය මගින් එක් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන් සඳහා ප්‍රතිපාදන නිදහස් කරනු ඇති අතර (එක් ගුරුවරියක් සඳහා මාස 04 කට වරක් රු.1000/- බැගින් ගෙවීමට නියමිතය) ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අක් මුදල් නිදහස් කිරීමත්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් මගින් අදාල පෙර පාසල් ගුරුවරියන්ගේ බැංකු ගිණුමට දීමනාව යොමු කිරීමත් සිදුවිය යුතුය.

**ප්‍රගතිය වාර්තා කිරීම**

05. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් අදාල ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව සිව් මාසික ප්‍රගති වාර්තාව CS/LD 04 ආකෘතියට අදාලව මුල් ළමාවිය සංවර්ධන සහකාර, දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී වෙත යොමු කරන්න. (නිලධාරියෙකු නොමැති දිස්ත්‍රික්ක වල අදාල ප්‍රගතිය සෘජුවම ළමා ලේකම් කාර්යාලය වෙත වාර්තා කල යුතුය.)

**අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය විට**

06. අවශ්‍ය අමතර ප්‍රතිපාදන සිව් මාසික ප්‍රගතිය වාර්තා කරන අවස්ථාවේම CS/LD 04 ආකෘතියෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ඉදිරිපත් කළ යුතු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් එම ඉල්ලීම් CS/LD 03 ආකෘතිය මගින්ම ළමා ලේකම් කාර්යාලය වෙත නැවත ඉදිරිපත් කල යුතුය.

**දීමනාව ලබාගත් බව තහවුරු කිරීම**

07. වර්ෂය අවසානයේ දීමනාව ලබාගත් බවට ගුරුවරියන්ගෙන් අත්සන ලබා ගත යුතු අතර (ලබාගත් මුළු මුදල ද සටහන් කර, CS/LD 02 ආකෘතියේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිටපතේ අදාල තීරුවේ) එහි සහතික කරන ලද ඡායා පිටපත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ළමා ලේකම් කාර්යාලයට යොමු කල යුතුය.

**08. ප්‍රතිලාභීන් තෝරා ගැනීම පහත නිර්නායක වලට අදාලවම සිදුකල යුතුය.**

(අ) අදාල අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම අනිවාර්යය වේ.

(අවම අධ්‍යාපන සුදුසුකම යනු අ.පො.ස. සා/පෙළ විභාගයෙන් මව්බස සහ ගණිතය සමත් වී ඕනෑම විෂයන් තුනකට සම්මාන සාමාර්ථ සහිතව විභාගය සමත් වී තිබීම සහ මුල් ළමා විය රැකවරණය හා සංවර්ධනය සම්බන්ධ අධ්‍යාපන සුදුසුකමක් [ඩිප්ලෝමාව /සහතික පත්‍ර]ලබා තිබීම වේ.)

(ආ) රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයකින් පෙර පාසල් ගුරුවරියන් සඳහා ලබාදෙන දීමනාවක් නොලබන අයෙකු විය යුතුය. (පෙර පාසල් සංවර්ධන සමිති වෙත ලබාදෙන යම් දීමනාවක් වේ නම්, අදාල දීමනාවෙන් කිසිදු ප්‍රමාණයක් පෞද්ගලිකව ගුරුවරිය වෙත නොලැබෙන බවට දීමනාව ලබාදෙන ආයතනයෙන් හා සංවර්ධන සමිතිය මගින් තහවුරු කර ගැනීමෙන් පසු දීමනාව ලබා දිය හැකියි.)

(ඇ) පෙර පාසල අදාල පළාත් සභා පෙර පාසල් ඒකකයේ/ පළාත් දෙපාර්තමේන්තුවේ/ අධිකාරියේ* ලියාපදිංචි වී (ලියාපදිංචි කර 2017-01-01 දිනට අවම වශයෙන් වසරක කාලයක් වත් සපුරා තිබිය යුතුය.) තිබිය යුතු අතර පෙර පාසල මගින් දරුවෙකුගෙන් අයකරගන්නා මාසික ගාස්තුව රු.1500/-ට වැඩි නොවිය යුතුය.(පෙර පාසල් සංවර්ධන සමිති මගින් තහවුරු කිරීම සිදුකර ගත හැක.)

(ඈ) අදාල ගුරුවරියගේ වයස අවුරුදු 18-60 අතර විය යුතුය.

(ඉ) 2017.01.01 දිනට පෙර පාසල් ගුරුවරියගේ අඛණ්ඩ සේවා කාලය අවම වශයෙන් වසර තුනක් විය යුතුය.

(ඊ) පෙර පාසල් ගුරුවරිය පූර්ණකාලීනව එම වෘත්තියේ යෙදෙන අයෙකු විය යුතුයි. (තාවකාලික/ වැඩ ආවරණය කරන ගුරුවරියන් දීමනාව ලැබීමට සුදුසුකම් නොලබයි.)

(උ) ප්‍රාදේශිය සභාවේත්, ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේත් අධීක්ෂණයෙන් ක්‍රියාත්මක වන පෙර පාසල් ගුරු සංගමයේ සාමාජිකත්වය ලබා තිබිය යුතුය.

09. **විශේෂ කරුණු -**

( අ) අදාල පළාත් සභාව මඟින් පෙර පාසල් ලියාපදිංචි කිරීමේ ප්‍රඥප්තියක්/ ක්‍රියා පිළිවෙලක් සකස් කර නොමැති අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම්ගේ අභිමතය පරිදි සකස් කරගත් ක්‍රියා පිළිවලකට අදාලව අනුමැතිය ලබා දිය හැක.

(ආ)ඉහත 01හා 02 හි දක්වා ඇති ආකෘතීන් සම්පූර්ණ කර ගැනීම, නිර්දේශ හා අනුමත කිරීම් වාර්ෂිකව සිදු කිරීම සෑහේ. යම් ගුරුවරියකව වර්ෂ මධ්‍යයේ වැඩසටහනට එක් කර ගැනීමට අවශ්‍ය විට එම ගුරුවරියන්ට පමණක් අදාලව නියමිත නිර්දේශ හා අනුමත ක්‍රියාවලි අනුගමනය කල යුතු අතර එසේ ආකෘතීන් සකස් කල පසු වැඩසටහනට ඇතුලත් කර ගන්නා ගුරුවරියන් පිළිබඳ නියමිත තොරතුරු එම අවස්ථාවලට, අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ළමා ලේකම් කාර්යාලය වෙත යොමුකල යුතුයි.

(ඇ) වැඩසටහනට අදාල 2017 කාල රාමුව ඇමුණුම 01 මඟින් දැක්වේ

චන්ද්‍රානි සේනාරත්න

ලේකම්

පිටපත්: 01. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය

02. ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
03. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
04. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරු
05. පළාත් අධ්‍යාපන ලේකම්වරු
07. සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන්
08. සියලුම පළාත් පෙර පාසල් ඒකක ප්‍රධානීන්
09. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව

} කාරු.දැ.ගැ.පි සහ අ.ක.ස